www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලේ වැකි සඳුදා: දිනක් තුල 74,000කගේ රැකියා අහෝසි කිරීම නිවේදනය කෙරේ

## Bloody Monday: 74,000 layoffs announced in one day

**ටොම් එලී විසිනි**
**2009 ජනවාරි 27**

ඊයේ දිනය තුල හාම්පුතුන් විසින් එක්සත් ජනපදයේ හා ජාත්‍යන්තරව රැකියා දහස් ගනනක් අහෝසි වන බවට කල නිවේදනය වනාහි, අර්බුදය ඇමරිකාව හා ලෝක ආර්ථිකය පුරා පැතිරී යාමේ වේගය පිලිබඳ සලකුනක් මෙන්ම ඒවාට ප්‍රතිචාර වශයෙන් ආන්ඩු ගත් පියවරයන් බෙහෙවින් ඉක්මවා යාමකි.

රැකියා අහෝසිය ප්‍රධාන කොට ම මෙසේ වාර්තා විය.

*ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි බැර යන්ත්‍රෝපකරන නිෂ්පාදනයේ ලෝක ප්‍රමුඛයා වන කැටපිලර් සමාගම 2009 මුල් කාර්තුව තුල රැකියා 20,000 අහෝසි කරන බව වාර්තා කරයි.

*ඖෂධ නිෂ්පාදනයේ නියැලි ෆයිසර් සමාගම ඩොලර් බිලියන 68 වූ තරගකාරී වයිත් සමාගම අත්පත් කර ගැනීමෙන් පසුව එහි පලමු තුවාලකරුවා වූයේ අස් කරන බව නිවේදනය කර තිබෙන කම්කරුවන් 8,000 ය.

*සෙලියුලර් දුරකථන නිෂ්පාදනයට සම්බන්ධ ස්ප්‍රින්ට්නෙක්සෙල් සමාගම සිය ශ්‍රම බලකායෙන් සියයට 14 ක් වන 8000 ක් කම්කරුවන් මාර්තු 31 වන විට ඉවත් කරනු ඇත. වසරකට මඳක් වැඩි කාලයකට පෙර එය රැකියා 4,000 අහෝසි කලේය.

*එක්සත් ජනපදයේ විශාලතම නිවාස යථාවත් කිරීමේ හෝම් ඩිපෝ සමාගම රැකියා 7,000 කපාහරින බවත් එක්ස්පෝ නිවාස සැලසුම් අංශයේ මධ්‍යස්ථාන 34 ක් වසා දමන බවත් නිවේදනය කරයි.

*මෝටර් රථ කර්මාන්තයේ යෝධයෙකු හා සිය පැවැත්ම සඳහා සටනක නියුතුව සිටින ජෙනරල් මෝටර්ස්, දැනටමත් විරැකියා අනුපාතය සියයට 10 ඉක්මවා ඇති ඔහායෝ හා මිචිගන් ප්‍රාන්තවල සිය කම්හල් වලින් තවත් 2,000 ක් ඉවත් කරන බව නිවේදනය කරයි.

ෆවානේ නිෂ්පාදක කෝරස් ගෲප් බ්‍රිතාන්‍යයේ 2,500 ද ඇතුලුව 3,500 ද, කාර්තුවක සිදුවූ සිය පලමු අලාභයෙන් පසුව අයිඑන්ජී නෙදර්ලන්ත බැංකුව 7,000 ද, රැකියා අහෝසි කරන බව වාර්තා විය.

නිවේදනය වූ රැකියා අහෝසියේ වේගය හා පරිමාව ආර්ථික අර්බුදයේ ඓතිහාසික පරිමානය එලිමහනට ගෙනැවිත් තිබේ. චැලෙන්ජර්, ග්‍රේ ඇන්ඩ් ක්‍රිස්මස් කෝපරේෂන් යන රැකියා වෙලඳපොලට සම්බන්ධ ආයතනයේ ප්‍රධාන විධායක ජෝන් චැලෙන්ජර් දිනයේ ලේ ගැලීම පිලිබඳව මෙසේ පැවසීය. ''අද දිනයේ විශේෂත්වය නම් රැකියා අහෝසිය ගැන ආර්ථිකයේ සෑම කොනකින්ම අසන්නට ලැබීමයි. සාමාන්‍යයෙන් නම් එසේ අසන්නට ලැබෙන්නේ විශේෂයෙන් ම තදින් පහර කෑමට ලක්'වන ක්ෂේත්‍රයන් තුලිනි. මේ පසුබෑම නිවාස හා මූල්‍ය සේවාවන් වෙත යොමුව තිබුන ද, මෝටර් රථ අංශය ද ඊට ඇදී ආවේය. පසුබෑමේ ඊලඟ රැල්ල පහර දෙන විට දැන් තාක්ෂනික හා සිල්ලර අංශයන් ද ඊට එක්ව තිබේ..

2009 වසර තුල මේ වන විට, චැලෙන්ජර් ගනන් බලා ඇති අන්දමට 128,600 ක් දොට්ට දැමීම් නිවේදනය කර ඇත්තේ ප්‍රධාන සමාගම් අතරින් 19 ක පමනි. එය ගනන් බලන්නේ ජනවාරි මාසය තුල එක්සත් ජනපද රැකියා අවස්ථාවන් 600,000 ක් අහෝසි වන බවටය. මෙය එක දිගට අඩ මිලියනයකින් රැකියා අහෝසි වූ තෙවන මාසය හා හාරලක්ෂයකට වැඩි පස්වන මාසය වේ. මෙය 1939 වසරේ ආරම්භය දක්වා දිවෙන එවන් ප්‍රථම අවස්ථාවයි. මාර්කට් වොච් වාර්තා කලාය.

මහා පරිමානයේ දොට්ට දැමීම් ඇඟවුම් කරන්නේ 2008 වසර තුල කැපී ගිය මිලියන 2.6 ක රැකියා ප්‍රමානය 1945 න් පසුව වාර්තා වූ වැඩිම සංඛ්‍යාව බවය. මෙය 2009 වසර තුල බෙහෙවින්ම ඉක්මවා යෑමට නියමිතය. වසර 16 කට පසුව ඉහල ම මට්ටම සලකුනු කල පසුගිය දෙසැම්බරයේ වාර්තාගත නිල විරැකියා අනුපාතයවන සියයට 7.2 න් ඉහලට එය නගිනු ඇත.

වයිත් අත්කර ගැනීමට සම්බන්ධිතව ෆයිසර් නිවේදනය කල දොට්ට දැමීම් 8,000, මේ මාසය තුල

ආයතනය නිවේදනය කල එවැනි තුන්වන අවස්ථාවයි. ජනවාරි මුල එය පර්යේෂකයන් 800 ක් ඉවත් කල අතර 16 වන දින වෙළඳ නියෝජිතයන් 1,300 නෙරපා දැමීය. එහෙත් මේ ආරම්භය පමනි. 26 වන දින ඒකාබද්ධ සමාගම් දෙකේ ශ්‍රම බලකායෙන් සියයට 15 ක් එනම් දල වශයෙන් තවත් 12,000 ක් අවසාන වශයෙන් නෙරපා හැරීමේ සැලසුම් එය නිවේදනය කලේය.

ෆයිසර්හි නෙරපා හැරීම් හෙලිදරව් කරන්නේ, ප්‍රථමයෙන් විශාලතම බැංකුවලට මුක්කු ගැසීමේ කාර්යයට අත ගසමින් ආර්ථික අර්බුදයට මැදිහත්වූ ආන්ඩුවේ පන්ති ස්වභාවයයි. වයිත් සමාගම අත්කර ගැනීමට ෆයිසර් සමාගමට අවස්ථාව ලබා දුන්නේ ඩොලර් බිලියන 4.5 බැගින් බැන්ක් ඔෆ් ඇමරිකා, සිටිගෲප්, ගෝල්ඩ්මන් සැක්ස්, ජේපීමෝර්ගන් චේස් හා බාක්ලේස් බැංකු මඟින් සැපයුනු නය මඟිනි.

බරක් ඔබාමා ද ඇතුලු පක්ෂ දෙකේම දේශපාලඥයින් ඔක්තෝබර් මාසයේ දී දැඩි ලෙස කියා සිටියේ ඊනියා ආපදා වත්කම් සහන වැඩ පිලිවෙල (ටාර්ප්) යටතේ ප්‍රධාන මූල්‍ය ආයතන වලට ඩොලර් බිලියන සිය ගනනින් ලබා දීම ක්ෂනික අවශ්‍යතාවක් බවය. ඔවුන් කියා සිටියේ මෙහි ප්‍රතිඵල වශයෙන් ‍රැකියා නිර්මානය වන බවය. එහෙත් ප්‍රතිඵලය එහි විරුද්ධ පැත්තයි.

26 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* සමීක්ෂනයකින් තහවුරු කලේ ප්‍රධාන ටාර්ප් සහනලාභීන් නය දීම කපාහැර ඇති බවයි. එහෙත් ෆයිසර් සමාගම සම්බන්ධයෙන් එසේ නොවූ අතර අමතර ‍රැකියා දහස් ගනනක් කපා හැර ඖෂධ කර්මාන්තයේ ඒකාධිකාරය තව තවත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය මහා බැංකු මඟින් සපයන ලදී.

සමූහ දොට්ටදැමීම් පිලිබඳව වෙළඳපොලවල පොදුවේ පැවතියේ උද්යෝගයකි. කැටපිලර් සමාගම හැරෙන්නට දොට්ට දැමීම් නිවේදනය කල සියලු සමාගම්වල කොටස් අගය සියයට 1.2 සිට සියයට 20.1 දක්වා ඉහල ගිය අතර, වෙළඳපොල බලාපොරොත්තු සුන් කරමින් රිනාත්මක ආදායම් වාර්තාවක් ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව කැටපිලර් සමාගමේ කොටස් මිල පහත වැටුනි.

කැටපිලර් සමාගමේ කලමනාකරන මට්ටමේ ‍රැකියා 5,000 ක් අහෝසි වන අතර දැනට මත් 2,500 දෙනා එය පිලිගෙන ඇත. කොන්ත්‍රාත් පදනමේ කම්කරුවන් 8,000 ක් ද, ස්ථිර කම්හල් කම්කරුවන් 4,000 ක් ද ඉවත් කර ඇත. සමාගම වේතන හා වැටුප් කැටි කිරීමක් ද නිවේදනය කර තිබේ.

කැටපිලර් සමාගමේ අලෙවිය පහත වැටීම ආර්ථික අර්බුදය වේගයෙන් ගැඹුරු වන බවට තවත් සලකුනකි. කැටපිලර්හි ප්‍රධාන සේවාදායකයන් වන්නේ ඉදිකිරීම්, කැනීම් හා ඉඩම් සංවර්ධනය කිරීමේ ව්‍යාපාරන්හි නියුතු සමාගමේ ම සේවකයන් ය.

කැටපිලර්හි ප්‍රධාන විධායක ජිම් ඕවන්ස් කියා සිටියේ ''දෙසැම්බරයේ දී අප බොහෝ කොට ම බිත්තියට හේත්තුවී ඇති'' බවයි. *මෝර්නිංස්ටාර්* විශ්ලේෂක ජෝන් කීනි වැඩි දුරටත් පැවසුවේ ''එය වසරේ පලමු කාර්තුවටත් පැතිර යමින් තත්වය තවත් නරක අතට හැරෙනු ඇත. එය අඩුම තරමින් වසරේ පලමු භාගය සඳහා නපුරු දර්ශනයක් වනු ඇති'' බවය.

ජෙනරල් මෝටර්ස් නිවේදනය කල දොට්ට දැමීම් 2,000 ට අමතරව, ඉදිරි හය මාසය තුල එය උතුරු ඇමරිකාවේ කම්හල් දහයක නිෂ්පාදනය අත් හිටුවන බව ද වාර්තා කලේය. මාර්තු 30 දින මිචිගන්හි එහි ලැන්සිං කම්හලේ දෙවන වැඩ මුරයෙහි කම්කරුවන් 1,200 ක් ද, අප්‍රේල් 6 වන දින ඔහායෝහි ලොඩ්ස්ටවුන් කම්හලේ දෙවන වැඩ මුරයෙන් තවත් 800 ක් ද ඉවත් කෙරෙයි.

නව නෙරපාහැරීම්වල හා නිෂ්පාදනය අත්හිටුවීමේ අරමුන ''වෙළඳපොලේ ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනය පෙල ගැස්වීම'' බව ජෙනරල් මෝටර්ස් ප්‍රකාශ කරයි. නරකම තත්වයක් ලෙස දැනටමත් වාර්තාවී ඇති 2008 වසරේ නව මෝටර් රථ අලෙවියේ ඒකක මිලියන 13.2 සිට මෙම වසරේදී ඒකක 10.5 දක්වා වෙළඳපොල හැකිලීයනු ඇතැයි විශ්ලේෂකයෝ අනාවැකි පල කරති.

අනෙකුත් ක්ෂේත්‍රයන් ගත් කල, රියල්ටර්ස් ජාතික සම්මේලනයේ අලුත් වාර්තාවකට අනුව එක්සත් ජනපදයේ නිවාස වටිනාකම් තියුනු ලෙස පහත වැටී ඇති බව පෙන්වයි. නොවැම්බරයේ වාර්තා ගත නිවාස අලෙවියේ පහල ම අනුපාතය දෙසැම්බරයේ දී ආන්තිකව ඉහල නැග තිබුන ද, මධ්‍යම මට්ටමේ නිවාස මිල එහි තියුනුම වැටීම වාර්තා කරමින් ඩොලර් 175,400 ක් දක්වා සියයට 15.3 කින් පහල ගියේය.

වෙන්දේසි කරන දේපල පිලිබඳ විශේෂඥ ආයතනයක් වන රියල්ටි ට්‍රැක්හි වෙනත් සමීක්ෂනයකට අනුව වෙළඳපොල තත්වය යථාවත් වනු ඇතැයි යන බලාපොරොත්තුව මත අත්පත්කර ගැනීමේ බැංකු, එසේ අත්පත් කරගත් නිවාස මිලියන ගනනක් වෙන්දේසියට නොදමා රඳවාගෙන සිටිති. නොවරදවා ම වෙළඳපොල කරා පැමිනීමට නියමිත මෙම නිවාස, නිවාස අගය තව දුරටත් බාදනය කරනු ඇත. බොහෝ එක්සත් ජනපද පවුල්වල මූලික වත්කම වන්නේ නිවසයි.

30 වන සිකුරාදා වන විට ආන්ඩුව සිව්වන කාර්තුවේ ආර්ථික වර්ධනය පිලිබඳ එහි තක්සේරුව ඉදිරිපත් කිරීමට නියමිතය. ආර්ථිකවේදීන් අතර පොදු පිලිගැනීම වන්නේ ආර්ථිකය වාර්ෂික අනුපාතයට අනුව සියයට 5.4 කින් හැකිලී ගිය බවයි. එය 1982 න් පසු වේගවත්ම හැකිලීම වන්නේය.


© www.wsws.org